# වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය (NEVIDA)

(ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය)

## පුරප්පාඩු

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 2018 අංක 32 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද, වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ <u>රියදුරු</u> (පුරප්පාඩු - 03) තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### රියදුරු - පුරප්පාඩු තනතුරු 03

**01. වැටුප් පරිමාණය :** PL 3-2016
රු.[26,290 -10 x 270 -10 x 300 -10 x 330 - 12 x 350 - 39,490/-] (මාසික)

**02. වයස :**
අයදුම්කරුගේ වයස 2024.06.29වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**03. සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින්**

අ.පො.ස. (සා.පෙ.ළ) විභාගයෙන් විෂයයන් 06ක්, අවම වශයෙන් සම්මාන සාමාර්ථ 02ක් සහිතව උපරිම වශයෙන් වාර දෙකක(02)දී සමත්වී තිබීම

**සහ**

බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබා තිබීම හා වාහන පැදවීමේ බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් **වසර තුනක (03)** පළපුරුද්ද

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබාතිබීම හා වාහන පැදවීමේ බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් **වසර තුනක (03)** පළපුරුද්ද

**සහ**

ප්‍රාථමික අර්ධ නිපුණතා (PL2) හෝ ප්‍රාථමික නුපුහුණු (PL1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් **වසර පහක** (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර තිබීම.

**04. වෙනත් සුදුසුකම්:**

සෑම අයදුම්කරුවෙකු ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට මෙන් ම දිවයිනේ ඕනෑ ම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**05. බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

අයදුම්පත් කැඳවීමෙන් පසු ව අධිකාරිය විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයේ හා ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙලට පත්වීම් සිදු කරනු ලැබේ. (සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන් ම ආයතනික බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අදාළ වේ.)

**06. තනතුරේ ස්වභාවය :-**

මෙම තනතුර ස්ථිර වන අතර සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත ය.

**07. අයදුම්පත ඉදිරිපත් කළ යුතු ක්‍රමවේදය :-**

ඉහත තනතුර සඳහා සෑම අතින් ම සුදුසුකම් ලත් අයදුම්කරුවන් මේ සමග ඉදිරිපත්කර ඇති ආකෘතිය පරිදි තමා විසින් සකස් කරන ලද අයදුම්පතක් ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, සේවා පළපුරුද්ද සනාථකිරීමේ සහතිකපත් හා වෙනත් කුසලතා සහතිකවල පිටපත් සමග **සභාපති, වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය, අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ-03 ලිපිනයට 2024.06.29 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතු ය. (අයදුම්පත බහාලන ලිපි කවරයේ **වම්පස ඉහළ කෙළවරේ "රියදුරු තනතුර සඳහා අයදුම් කිරීම" වශයෙන් සඳහන් කළ යුතුය.)**

රාජ්‍ය /රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තම ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් 2024.06.29 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

ප්‍රමාද වූ අයදුම්පත්/ අසම්පූර්ණ අයදුම්පත්/ නියමිත ආකෘතියෙන් තොර ව ඉදිරිපත් කළ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08. වෙනත් විස්තර :-**

වැඩිදුර තොරතුරු www.smehci.gov.lk වෙබ් අඩවියේ "**පුරප්පාඩු**" තීරයේ දක්වා ඇත.

**සභාපති,**
**වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය,**
**අංක 45, ශාන්ත මයිකල් පාර,**
**කොළඹ-03**